අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/01/01/16 උප (IV වෙළුම)　ඔබේ යොමුව / உமது இல. / Your Ref.　දිනය / திகதி / Date 2020.08.20

චක්‍රලේඛ අංක: 21/2020

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>ගුරු උපදේශක සේවයේ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම</u>**

අංක 2182/36 හා 2020.07.01 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ගුරු උපදේශක සේවයේ (මින් ඉදිරියට සේවය ලෙස දැක්වෙන) සේවා ව්‍යවස්ථාව 2020.07.01 වන දින සිට ක්‍රියාත්මක වේ. ඒ අනුව දැනට ගුරු උපදේශක යන තනතුරු නාමය හා ඒ හා ආනුශංගික තනතුරු නාම යටතේ සේවය කරන ගුරුභවතුන් පහත දක්වා ඇති විධිවිධාන යටතේ ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මින් ඉදිරියට ගුරුභවතුන් ලෙස හඳුන්වනු ලබන්නේ විධිමත් පත්වීමක් ලබා ගුරු උපදේශක කාර්යභාරය ඉටු කරන ගුරුභවතුන්ය.

## 1. අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රමවේදය

1.1 ගුරු උපදේශක සේවයේ සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2020.07.01 දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.

1.2 නියමිත දිනට 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති GE- 01 හෝ GE- 02 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ 14.1 වගන්තිය පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

1.3 සේවා කාලය ගණන් ගනු ලබන්නේ ගුරු උපදේශක තනතුරට පත්කරන ලද දිනය පදනම් කර ගෙන ය.

කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නො වෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය.

වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතු ය.

(i) GE-03 - I ශ්‍රේණිය

(අ) ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවයේ වසර විස්ස (20) කට නො අඩු සක්‍රිය හා සතුටු දායක සේවා කාලයක් සහිත සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම සඳහා විධිමත්ව පත්කර ඇති එම තනතුරට අදාළ වසර දහය (10) කට නොඅඩු සේවා පළපුරුද්දක් සහිත ගුරුභවතුන් ගුරු උපදේශක සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) ගුරු උපදේශක සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරින්ගේ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර විස්ස (20) ක සක්‍රිය හා සතුටු දායක සේවා කාලය සහ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීම සඳහා විධිමත්ව පත්කර වසර දහය (10)ක සේවා පළපුරුද්ද සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වන ගුරු උපදේශක තනතුරේ පලපුරුද්ද සහිත සක්‍රිය හා සතුටුදායක සේවා කාලය II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙසට සලකනු ලැබේ.

(ii) GE-03 - II ශ්‍රේණිය

(අ) ඉහත අනු අංක හී සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර දහය (10) කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම සඳහා විධිමත්ව පත්කර ඇති ගුරුභවතුන් ගුරු උපදේශක සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ආ) ගුරු උපදේශක සේවයේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ ගුරු උපදේශක තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම සඳහා විධිමත්ව පත්කර ඇති දිනය හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර දහය (10) ක සක්‍රිය හා සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට වන ගුරු උපදේශක තනතුරේ පලපුරුද්ද සහිත සක්‍රිය හා සතුටුදායක සේවා කාලය II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙසට සලකනු ලැබේ.

## 2. අන්තර්ග්‍රහණය

### 2.1 අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම

ඇමුණුම 01 අයදුම්පත්‍රය සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතු කාලය 2020.12.31 දිනෙන් අවසන් වේ.

2.2 අන්තර්ග්‍රහණය සඳහා මනාපය ප්‍රකාශ කිරීම

සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරන ගුරුභවතුන් අන්තර්ග්‍රහණය කිරීමට කටයුතු කරනු ලැබේ.

සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නොකරන ලද ගුරුභවතුන් හට ශ්‍රී ලංකා ගුරු සේවයේම තවදුරටත් සේවය කිරීමට ඉඩ දෙනු ලැබේ.

2.3 කාර්යක්ෂමතා කඩඉම

සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන සියලුම නිලධාරීන් සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ සිට වසර පහ (05)ක කාලයක් තුළ ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ 8.1 වගන්තිය යටතේ සඳහන් පළමුවන කාර්යක්ෂමතා කඩඉම සහ 9.1 වගන්තිය යටතේ සඳහන් සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතු ය.

2.4 අන්තර්ග්‍රහණය කරන කාල සීමාව තුළ විශ්‍රාම යනු ලබන ගුරුභවතුන්

2020.07.01 දිනෙන් පසු දිනක විශ්‍රාම යාමට නියමිත ගුරුභවතුන් අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කරන ලද අයදුම්පත්‍රයක් විධිමත් ලෙස ඉදිරිපත් කර ඇත්නම් සේවයට අන්තර්ග්‍රහණය කර විශ්‍රාම ගන්වන අතර එසේ නොවන විට ශ්‍රී ලංකා ගුරු සේවයේ සිටියා සේ සළකා විශ්‍රාම ගන්වනු ලැබේ.

2.5 අන්තර්ග්‍රහණය කරනු ලබන විෂයය

විධිමත් පත්වීම් ලැබ ගුරු උපදේශක තනතුරෙහි නිරත ගුරුභවතුන් ගුරු උපදේශක තනතුරට අදාළ පත්වීම් විෂයයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ගුරු උපදේශක සේවය සඳහා අන්තර්ග්‍රහණය කිරීමේ දී අදාළ කර ගනු ලබන විෂයයන් ඇමුණුම 06 හි දැක්වේ.

ගුරු උපදේශක තනතුරට අදාළ පත්වීම් විෂයය වර්තමානයේ පාසල් විෂයය නිර්දේශයේ නොමැති නම් හෝ ඇමුණුම 06 හි ද සඳහන් නොවේ නම් එම ගුරුභවතුන් ඇමුණුම 06හි සඳහන් විෂයයන් අතුරින් ඔවුන් දැනට අධීක්ෂණය කරනු ලබන විෂයය සඳහා අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

2.6 අන්තර්ග්‍රහණය සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්

ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තිය පරිදි සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන් ඔවුන් අයදුම්කරන අවස්ථාවේ යෙදී සිටි සේවයේ තවදුරටත් සිටින්නා සේ සලකනු ලැබේ.

## 3. අන්තර්ග්‍රහණයට අදාළව ගුරුභවතුන්ගේ කාර්යභාරය

3.1 අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම

2020.07.01 වන දිනට සේවයේ නියුතු ගුරුභවතුන් මෙහි ඇමුණුම 01 අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් නියමිත දිනට ප්‍රථම මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

මෙම සේවයට අන්තර්ග්‍රහණය වීමට සුදුසුකම් ඇති එහෙත් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නො කරන ගුරුභවතුන් පසුව වෙනස් කළ නොහැකි ප්‍රකාශයක් ඇමුණුම 03 අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් 2020.12.31 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

### 3.2 අන්තර්ග්‍රහණය කරන කාල සීමාව තුළ විශ්‍රාම යනු ලබන ගුරුභවතුන්

2020.07.01 දිනෙන් පසු දිනක විශ්‍රාම යාමට නියමිත ගුරුභවතුන් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද අයදුම්පත්‍රයක් විශ්‍රාම ගැනීමේ දිනට පෙර විධිමත් ලෙස ඉදිරිපත් කළ යුතු ය.

මෙම සේවයට අන්තර්ග්‍රහණය වීමට සුදුසුකම් ඇති එහෙත් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ නො කරන ගුරු උපදේශක කාර්යයෙහි යෙදී 2020.07.01 දිනෙන් පසු දිනක විශ්‍රාම ගිය ගුරුභවතුන් ඇමුණුම 03 අනුව පසුව වෙනස් කළ නොහැකි ප්‍රකාශයක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් 2020.12.31 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 4. අන්තර්ග්‍රහණයට අදාළව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යභාරය

### 4.1 අන්තර්ග්‍රහණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීම කළ යුතු බව දැන්වීම

ඇමුණුම 01හි දැක්වෙන ආකෘතියට අනුව තම අයදුම්පත්‍රය සම්පූර්ණ කර අවසන් දිනය නොඉක්මවා එවන ලෙසට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් තමා යටතේ සේවය කරන අන්තර්ග්‍රහණය වීමට නියමිත සියළුම ගුරුභවතුන් වෙත ලිඛිතව දැනුම්දිය යුතු ය.

දීර්ඝකාලීන දේශීය නිවාඩු ලබා සිටින, විධිමත් ලෙස විදේශ නිවාඩු ලබා විදේශගතව සිටින, වෙනත් ආයතනවලට තාවකාලිකව මුදාහැර ඇති, වැඩ තහනම් කර ඇති සහ සේවය අත්හිටුවා ඇති ගුරුභවතුන්ට ද ඔවුන් විසින් අවසන්වරට දැනුම් දී ඇති ලිපිනයන්වලට ලියාපදිංචි තැපෑලෙන් මේ බව දන්වා යැවිය යුතු ය.

### 4.2 අන්තර්ග්‍රහණය සඳහා මනාපය ප්‍රකාශ කරන ලද ගුරුභවතුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීම

4.2.1 ගුරුභවතුන් විසින් භාරදෙන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතු ය.

4.2.1.1 අයදුම්පත්‍රයේ ඇතුළත් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කර ඇති බව

4.2.1.2 දිනය යොදමින් සහතික කර අත්සන් තබා දින මුද්‍රා/ නිලමුද්‍රා තබා ඇති බව

4.2.1.3 අයදුම්පත්‍රයේ අනුපිටපතක් කලාප අධ්‍යාපන කාර්යාලයේ පවත්නා ගුරුභවතාගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කල යුතු බව

4.2.2. අයදුම්පත්‍ර (මුල් පිටපත්) මා වෙත එවන විට මෙම චක්‍රලේඛයට අමුණා ඇති ඇමුණුම 02 අනුකූලව සකස් කරන ලද ලේඛනයක් සමඟ එවිය යුතු ය.

4.2.3 ඒ අනුව අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පල කරන ලද ගුරුභවතුන්ගේ ප්‍රධාන ලිපි ගොනුව (master file) මනාපය ප්‍රකාශ කළ දින දක්වා වන සියලු ආයතනික කටයුතු නිම කර, ඇමුණුම 05 හි සඳහන් එක් එක් පිටු අංක පැහැදිලිව පෙනෙන පරිදි කොඩි කර පහත සඳහන් ලේඛන සමඟ 2021.01.31 දිනට පෙර මා වෙත එවිය යුතු ය.

i. මනාප ප්‍රකාශ පත්‍රය
ii. යාවත්කාලීන කරන ලද වර්යා සටහන් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්
iii. පරීක්ෂා කිරීමේ ලේඛනය (Check List) ඇමුණුම 05

4.2.4 අසම්පූර්ණ ලිපි ගොනු සම්පූර්ණ කර එවීම සඳහා නැවත එවීමෙන් සිදුවන පමාව වළක්වා ගැනීමට හැකි පමණ අවධානය යොමු කල යුතුය.

## 4.3 අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ නොකරන ගුරුභවතුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙම ප්‍රකාශ පත්‍ර එවන විට චක්‍රලේඛයට අමුණා ඇති ඇමුණුම 04 අනුව සකස් කරන ලද ලේඛනයක් 2021.01.31 දිනට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතු ය.

මේ පිළිබඳව මනාපය පල කරන හා පල නොකරන සියලුම ගුරුභවතුන්ගේ විස්තර එවීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ වගකීමක් වනු ඇත.

## 4.4 අන්තර්ග්‍රහණය කරන කාල සීමාව තුල විශ්‍රාම යන නිලධරයන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීම

2020.07.01 දින සිට මෙම චක්‍රලේඛය ප්‍රසිද්ධ කරන දින දක්වා ගුරු උපදේශක කාර්යයෙහි යෙදී විශ්‍රාම ගිය ගුරුභවතුන් හට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් මෙම චක්‍රලේඛය අනුව අයදුම්පත් ඉදිරිපත් කල යුතු බව ලිඛිතව දැන්විය යුතු අතර එම විශ්‍රාමික ගුරුභවතුන්ගේ අයදුම්පත් සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කළ යුතු ය.

## 4.5 අන්තර්ග්‍රහණය සඳහා මනාපය ප්‍රකාශ කළ /නො කළ ගුරුභවතුන්ගේ අයදුම්පත්‍ර හා පෞද්ගලික ලිපි ගොනු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවීම

**A ගොනුව -** මනාපය ප්‍රකාශ කල නිලධරයන්ගේ වාර්තාව ඉදිරියෙන් තබා මනාපය ප්‍රකාශ කල සියලුම නිලධාරීන්ගේ අයදුම්පත්‍ර ඊට පිටුපසින් වන සේ තබා අදාළ පළාත, කලාප කාර්යාලයේ නම හා A ගොනුව ලෙස ගොනුවෙහි ඉදිරිපස සඳහන් කර A ගොනුව ඉදිරිපත් කල් යුතුය.

**B ගොනුව -** මනාපය ප්‍රකාශ නො කළ නිලධරයන්ගේ වාර්තාව ඉදිරියෙන් තබා මනාපය ප්‍රකාශ නොකළ සියලුම නිලධාරීන්ගේ ප්‍රකාශ පත්‍ර ඊට පිටුපසින් වන සේ තබා අදාළ පළාත, කලාප කාර්යාලයේ නම හා B ගොනුව ලෙස ගොනුවෙහි ඉදිරිපස සඳහන් කර B ගොනුව ඉදිරිපත් කල යුතුය.

සියලුම ආයතනික කටයුතු නිම කරන ලද ගුරුභවතුන්ගේ පෞද්ගලික ලිපි ගොනු, A ගොනුව හා B ගොනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් හරහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත එවිය යුතුය.
අන්තර්ග්‍රහණ කටයුතු අවසන් කිරීමෙන් පසු පෞද්ගලික ලිපිගොනු ඔබ වෙත ආපසු එවීමට කටයුතු කරනු ලැබේ.

## 4.6 නොනිමි කාර්යයන්

සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද ගුරුභවතුන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුරු සේවය යටතේ 2020.07.01 දිනට පෙර ආරම්භ කරන ලද සියලුම ආයතනික කටයුතු අදාළ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අවසන් කළ යුතු ය

## 5. චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු

මෙම චක්‍රලේඛය මගින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගනිමින් මා විසින් සිදු කරනු ලැබේ.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරන මෙම චක්‍රලේඛයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතීනම් එවැනි විටක සිංහල මාධ්‍ය චක්‍රලේඛය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

......................................

මහාචාර්ය කේ.කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ඇමුණුම 01

## ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය සඳහා ඉල්ලුම් පත්‍රය

I කොටස

අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.

1. (i). අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :...........................................................................................

..........................................................................................................................................

ස්වාමීන්වහන්ස/ මහතා/ මහත්මිය/මෙනවිය *

(ii). අයදුම්කරුගේ සම්පූර්ණ නම : ......................................................................................

..........................................................................................................................................

ස්වාමීන්වහන්ස/ මහතා/ මහත්මිය/මෙනවිය *

(iii). වෙනත් නම් තිබේ නම් :

..........................................................................................................................................

(iv). නම් වෙනස් කලේ නම් මීට පෙර භාවිත කල නම (නම වෙනස් කර ඇත්නම් පමණි) :

..........................................................................................................................................

2.

| | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| (i). උපන්දිනය | | | |
| (ii). සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන (2020.07.01) දිනට වයස | | | |

3. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

4. (i).ස්ථිර පෞද්ගලික ලිපිනය

..........................................................................................................................................

..........................................................................................................................................

(ii). තැපැල් ලිපිනය :

..........................................................................................................................................

..........................................................................................................................................

(iii). විද්‍යුත් තැපැල් ලිපිනය : .....................................................................................

(iv). දුරකථන අංක , ජංගම : ...........................................................................................

ස්ථාවර : ..........................................................................................

රාජකාරි: ..........................................................................................

5. 2020.07.01 දිනට සේවය කරනු ලබන සේවා ස්ථානය හා එහි ලිපිනය :

(i). කලාප කාර්යාලයක් වේ නම් එහි

නම : ..........................................................................................................

ලිපිනය : ......................................................................................................

සේවා ස්ථානය අයත් පළාත : .........................................................................

(ii). කලාප කාර්යාලය හැර රජයේ වෙනත් ආයතනයක් නම් එහි

නම : ..........................................................................................................

ලිපිනය : ......................................................................................................

සේවා ස්ථානය අයත් පළාත : .........................................................................

6. ශ්‍රී ලංකා ගුරු සේවයෙහි/ ගුරු උපදේශක තනතුරෙහි පත්වීම්/උසස්වීම් ලැබී ඇති ආකාරය

| අනු අංකය | උසස්වීම | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|---|
| (i). | ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට පත්වීම ලද දිනය | | | |
| (ii). | ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ඇ) ශ්‍රේණියට පත්වීම/උසස්වීම ලද දිනය | | | |
| (iii). | ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (ආ) ශ්‍රේණියට පත්වීම/උසස්වීම ලද දිනය | | | |
| (iv). | ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට පත්වීම/උසස්වීම ලද දිනය | | | |
| (v). | ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-II ශ්‍රේණියට පත්වීම/උසස්වීම ලද දිනය | | | |
| (vi). | ශ්‍රී ලංකා ගුරු සේවයේ 2-I ශ්‍රේණියට පත්වීම/උසස්වීම ලද දිනය | | | |
| (vii). | ශ්‍රී ලංකා ගුරු සේවයේ I ශ්‍රේණියට උසස්වීම ලද දිනය | | | |
| ( viii) | ගුරු උපදේශක තනතුරට පත්වීම ලත් මුල් දිනය | | | |

7. (i). ඔබ ගුරු උපදේශක සේවයට පත් කර සිටින්නේ පහත නම් සඳහන් බලධාරීන් අතුරින් කවුරුන් විසින්ද යන්න

| අනු අංකය | පත්වීම් බලධාරියා | අදාළ වන බලධාරියා ඉදිරියේ √ ලකුණ යොදන්න. |
|---|---|---|
| 1. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් | |
| 2. | පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් | |
| 3. | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් | |
| 4. | වෙනත් (අදාළ තනතුර සඳහන් කරන්න.) | ............................................... |

(ii). ඉහත 6(viii) ට අදාළ ගුරු උපදේශක තනතුරෙහි පත්වීම් විෂයය ඇමුණුම 06හි සඳහන් විෂයයන් අතුරින් කුමන විෂයය ද ? (ඇමුණුම 06හි සඳහන් අදාළ විෂයය අංකය මෙහි ලියන්න.)

..........................................................................................................................

(iii). ඉහත 6(viii) ට අදාළ ගුරු උපදේශක තනතුරට අදාළ පත්වීම් විෂයය වර්තමානයේ පාසල් විෂයය නිර්දේශයේ නොමැති නම් හෝ ඇමුණුම 06 හි ද සඳහන් නොවේ නම් ඇමුණුම 06හි සඳහන් විෂයයන් අතුරින් දැනට අධීක්ෂණය කරනු ලබන විෂයය කුමක්ද ?

(ඇමුණුම 06හි සඳහන් අදාළ විෂයය අංකය මෙහි ලියන්න.)

..............................................................................................................................

8. (i). 2020.07.01 දිනට ගුරු උපදේශක තනතුරෙහි සේවා කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| අනු අංකය | සිට | දක්වා | තනතුර | සේවා ස්ථානය | මුළු සේවා කාලය |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2 | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |
| | | | | ගුරු උපදේශක තනතුරෙහි මුළු සේවා කාලය | |

(ii). ගුරු උපදේශක තනතුර හැර වෙනත් තනතුරක රාජකාරි ආවරණයෙහි යෙදී සිටියේ නම් ඒ පිළිබඳ තොරතුරු (අවශ්‍ය නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| අනු අංකය | සිට | දක්වා | තනතුර | සේවා ස්ථානය | මුළු සේවා කාලය |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |
| 5. | | | | | |

(iii). 2020.07.01 දිනට දරන තනතුරෙහි රාජකාරී විස්තරය (සැකෙවින්) :

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

9. (i).2020.07.01 දිනට ලබන වැටුපට අදාළ වැටුප් කේත අංකය :

| GE - 01 | GE - 02 |
|---|---|

(ii). ඉහත වැටුප් කේත අංකය හැර වෙනත් වැටුප් කේත අංකයක් නම් එම අංකය : ....................................

10. (i). ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර 20කදී වැටුප් වර්ධක උපයාගෙන ඇත්නම් එම වසර 20 පිළිබඳ විස්තර
(අඛන්ඩව වැටුප් වර්ධක උපයාගෙන තිබීම අදාළ නොවේ.)

| වැටුප් වර්ධකය | වර්ෂය | වැටුප් වර්ධකය උපයාගෙන ඇත/ නැත |
|---|---|---|
| 1 | | ඇත/ නැත |
| 2 | | ඇත/ නැත |
| 3 | | ඇත/ නැත |
| 4 | | ඇත/ නැත |
| 5 | | ඇත/ නැත |
| 6 | | ඇත/ නැත |
| 7 | | ඇත/ නැත |
| 8 | | ඇත/ නැත |
| 9 | | ඇත/ නැත |
| 10 | | ඇත/ නැත |
| 11 | | ඇත/ නැත |
| 12 | | ඇත/ නැත |
| 13 | | ඇත/ නැත |
| 14 | | ඇත/ නැත |
| 15 | | ඇත/ නැත |
| 16 | | ඇත/ නැත |
| 17 | | ඇත/ නැත |
| 18 | | ඇත/ නැත |
| 19 | | ඇත/ නැත |
| 20 | | ඇත/ නැත |

(ii). ශ්‍රී ලංකා ගුරු සේවයේ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද? ඔව්/ නැත

(iii). වැටුප් වර්ධක විලම්භනයවී ඇත්නම් ඒ පිළිබඳ විස්තර

| | සිට | දක්වා | වැටුප් වර්ධක විලම්භනයවී ඇති මුළු කාලය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

(iv). ඔබ ශ්‍රී ලංකා ගුරු සේවයට පත්වූ දින සිට මේ දක්වා වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබාගෙන තිබේද? ඔව්/ නැත

වැටුප් රහිත නිවාඩු හෝ අඩ වැටුප් නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර (අවශ්‍ය නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| | සිට | දක්වා | වැටුප් රහිත නිවාඩු /අඩ වැටුප් නිවාඩු ද යන්න | නිවාඩු වර්ගය ( උදා: විදේශ නිවාඩු/ ප්‍රසූත නිවාඩු) | මුළු වැටුප් රහිත නිවාඩු/අඩ වැටුප් නිවාඩු කාලය |
|---|---|---|---|---|---|
| 1. | | | | | |
| 2. | | | | | |
| 3. | | | | | |
| 4. | | | | | |

11.(i). ගුරු සේවයේ සේවා කාලය තුළ කිසියම් වංක ක්‍රියාවකට හෝ දූරාචාරයකට තුඩු දෙන වෙනත් විෂමාචාර ක්‍රියාවකට හෝ දඬුවමක් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර

.............................................................................................................................................

.............................................................................................................................................

(ii). නිම නොවූ විනය ක්‍රියාමාර්ගයක් වේ නම් ඒ පිළිබඳව වර්තමාන තත්ත්වය

.............................................................................................................................................

.............................................................................................................................................

12. ඉහත නම් සඳහන් මා 2020.07.01 දින සිට ................................................ විෂයයට අදාළව ගුරු උපදේශක සේවයේ ………….. ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කර දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

මෙම අයදුම්පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හා වැරදි සහගත බව අන්තර්ග්‍රහණය වීමට පෙර අනාවරණය වුවහොත් මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, අන්තර්ග්‍රහණය වීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව අන්තර්ග්‍රහණය අවලංගු කළ හැකි බවත් මම දනිමි.

දිනය : ...............................

........................................

අයදුම්කරුගේ අත්සන

## 2 කොටස - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සම්පූර්ණ කළ යුතුයි.

පළාත් අධ්‍යාපන ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

අයදුම්කරු විසින් 1 සිට 12 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි ය. ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තිය අනුව පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය කරමි.

| අනු අංකය | සුදුසුකම | සුදුසුකම සපුරා ඇති / නැති බව |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවය වසර 20කට නොඅඩු සක්‍රිය සේවා කාලයක් සහිත වීම | ඇත / නැත |
| 2. | ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවය වසර 20කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත වීම | ඇත / නැත |
| 3. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ගුරු උපදේශක තනතුරට විධිමත්ව පත් කර තිබීම | ඇත / නැත |
| 4. | ගුරු උපදේශක තනතුරට පත්වීම් ලබාගත් දින සිට වසර 10කට නොඅඩු සේවා පලපුරුද්ද | ඇත / නැත |

ඒ අනුව ඉහත නම් සඳහන් ස්වාමීන්වහන්ස/ මහතා/ මහත්මිය/මෙනවිය 2020.07.01 දින සිට ................................................. විෂයයට අදාළව ගුරු උපදේශක සේවයේ ................................. ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./නොකරමි*. (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි.)

..................................................................................................................................................................................

......................................  ......................................................

දිනය.  කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන හා නිල මුද්‍රාව.

## 3 කොටස - පළාත් අධ්‍යාපන ලේකම්/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සම්පූර්ණ කළ යුතුයි.

ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

අයදුම්කරු විසින් 1 සිට 12 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි ය. ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තිය අනුව සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය කරමි.

ඒ අනුව ඉහත නම සඳහන් ස්වාමීන්වහන්ස/ මහතා/ මහත්මිය/මෙනවිය 2020.07.01 දින සිට ............................................ විෂයයට අදාළව ගුරු උපදේශක සේවයේ ............................ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./නොකරමි*. (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි.)

..........................................................................................................................................................

.................................... ....................................................

දිනය. පළාත් අධ්‍යාපන ලේකම් / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන හා නිල මුද්‍රාව.

* අනවශ්‍ය වචන කපා හරින්න.

ඇමුණුම 02

## ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කළ නිලධරයන්ගේ අයදුම්පත්‍ර එවීමේ ලේඛනය

.......................................................................................... කලාප කාර්යාලය

.......................................................................................................... පළාත

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්

| අනු අංකය | ගුරු උපදේශක තනතුරට පත්කරන ලද පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම තනතුර හා අදාළ විෂයය | මනාප ප්‍රකාශ කළ දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | මුළු අයදුම්පත්‍ර සංඛ්‍යාව | |

........................................................ කලාපයේ නිලධාරීන් ..............................කගේ අයදුම්පත්‍ර අන්තර්ග්‍රහණය සඳහා මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ..............................

දිනය :...................................

නිල මුද්‍රාව :

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ..............................

දිනය :...................................

නිල මුද්‍රාව :

ඇමුණුම 03

# ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල නොකරන නිලධාරීන් ලබාදිය යුතු ප්‍රකාශය

......................................................................................... කලාප කාර්යාලය

............................................................................................................ පළාත

I කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කල යුතුයි.

1. (i).නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................................................

   (ii). දැනට දරන තනතුර : ..........................................................................................

2. (i).සේවා ස්ථානයේ නම : ..........................................................................................

   (ii).සේවා ස්ථානයේ ලිපිනය :

..........................................................................................................................

..........................................................................................................................

   (iii). සේවා ස්ථානය අයත් පළාත : ..........................................................................................

   (iv). දුරකථන අංකය : ..........................................................................................

3. (i) උපන්දිනය : .......................................................... ..............................

   (ii) සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2020.07.01 දිනට වයස : ..............................................

   (iii). ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

4. අංක 2182/36 හා 2020.07.01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන වලට යටත්ව එම සේවාවට අන්තර්ග්‍රහණය වීමට මා සුදුසුකම් ලබා ඇති නමුත් එම සේවාවට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල නොකරමි. දැනට දරන තනතුරේ තවදුරටත් සේවය කිරීමට මනාපය පළ කරමි. තවද මෙම මනාපය පසුව වෙනස් නොකරන බව ද ප්‍රකාශ කරමි.

නිලධාරියාගේ අත්සන : ...............

දිනය :........................

## II කොටස - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සම්පූර්ණ කල යුතුයි.

නිලධාරියා විසින් 1- 3 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අත්සන : ........................................

දිනය : …………........

නිල මුද්‍රාව : ...............................

## III කොටස - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සම්පූර්ණ කල යුතුයි.

නිලධාරියා විසින් 1- 3 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ..............................

දිනය :....................................

නිල මුද්‍රාව : ..................................

ඇමුණුම 04

# මනාපය ප්‍රකාශ නොකළ නිලධරයන්ගේ වාර්තාව

.......................................................................................... කලාප කාර්යාලය

.......................................................................................................... පළාත

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්,

| අනු අංකය | ගුරු උපදේශක තනතුරට පත්කරන ලද පත්වීම් ලිපියේ අංකය | නිලධරයාගේ නම | නිලධරයාගේ නම තනතුර හා අදාළ විෂයය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| | | මනාපය ප්‍රකාශ නොකල මුළු නිලධාරීන් සංඛ්‍යාව | |

............................................................ කලාපයේ අන්තර්ග්‍රහණය සඳහා මනාපය ප්‍රකාශ නොකළ නිලධාරීන් ..............................කගේ ප්‍රකාශපත්‍ර මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ...............................

දිනය :.....................................

නිල මුද්‍රාව :

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ...............................

දිනය :.....................................

නිල මුද්‍රාව :

ඇමුණුම 05

# පරීක්ෂා කිරීමේ ලේඛනය (check list)

.................................................................................... කලාප කාර්යාලය

.................................................................................................... පළාත

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්

<u>ගුරු උපදේශකවරු ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කිරීම.</u>

නිලධාරියාගේ නම : .............................................................................

පිටු අංකය

| | | |
|---|---|---|
| 01. උප්පැන්න සහතිකය | ඇත/නැත | ................ |
| 02. ගුරු සේවයේ පත්වීම් ලිපිය | ඇත/නැත | ................ |
| 03. ගුරු සේවයේ සේවය ස්ථිර කිරීමේ ලිපිය | ඇත/නැත | ................ |
| 04. මුල් පත්වීමෙන් පසු නම වෙනස් කර ඇත්නම් එම ලිපිය | ඇත/නැත | ................ |
| 05. ශ්‍රී ලංකා ගුරු සේවයේ උසස් කිරීමේ ලිපි | ඇත/නැත | ................ |
| 06. ගුරු උපදේශක තනතුරට පත් කළ පත්වීමේ ලිපිය | ඇත/නැත | ................ |
| 07. 2020.07.01 දිනට සේවය කරනු ලබන ස්ථානයෙහි වැඩ භාර ගැනීමේ ලිපි | ඇත/නැත | ................ |
| 08. 2020.07.01 දිනට අධීක්ෂණය කරනු ලබන විෂයය ඉහත පත්වීම් විෂයය නොවේ නම් එම විෂයය විධිමත්ව පවරන ලද ලිපිය: | ඇත/නැත | ................ |
| 09. අවසන් වැටුප් පරිවර්තන ලිපිය | ඇත/නැත | ................ |
| 10. ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර 20ක පඩි වැඩි කිරීමේ සහතික පත්‍ර | ඇත/නැත | ................ |
| 11. ගුරු උපදේශක තනතුරට පත් කිරීමෙන් පසු ස්ථාන මාරු වූයේ නම් ඊට අනුමැතිය ලබාදුන් ලිපි | ඇත/නැත | ................ |
| 12. ගුරු උපදේශක තනතුරට පත් කිරීමෙන් පසු වෙනත් තනතුරුවල රාජකාරි ආවරණයට පත් කර ඇත්නම් ඊට අනුමැතිය ලබාදුන් ලිපි | ඇත/නැත | ................ |
| 13. වැටුප් රහිත/අඩ වැටුප් නිවාඩු අනුමත කර ඇත්නම් එම ලේඛන | ඇත/නැත | ................ |

14. ගුරු සේවයේ සේවා කාලය තුළ සිදුකර ඇති
කිසියම් වරදක් සම්බන්ධයෙන්
විනයානුකූල දඬුවමකට භාජනය වී සිටින්නේ
නම් ඊට අදාළ ලේඛන ඇත/නැත ................

15. යථාවත් කරන ලද චර්යා සටහෙනහි පිටපත ඇත/නැත ................

16. මනාපය ප්‍රකාශ කළ නිලධාරියාගේ /
නිලධාරිණියගේ ගුරු උපදේශක සේවයට
අන්තර්ග්‍රහණය කිරීමේ අයදුම්පත්‍රයෙහි පිටපත ඇත/නැත ................

අංක ...................... සිට ...................... දක්වා වූ පිටු සහිත පෞද්ගලික ලිපිගොනුවේ පිටු නිවැරදිව අංක කර පරීක්ෂා කර ඉදිරිපත් කරමි. ඉහත අංක 1 – 16 දක්වා වූ ලේඛනවලට අදාළ පිටු පමණක් පැහැදිලිව පෙනෙන සේ නොගැලවෙන සේ කොඩිකර ඇත.

සකස් කළේ

විෂය භාර කළමනාකරණ සහකාර අත්සන :...................................
දිනය : ......................

පරීක්ෂා කළේ

ප්‍රධාන කළමනාකරණ සහකාර අත්සන :........................................
දිනය : .....................

නිවැරදි බව සනාථ කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ..............................................
දිනය :....................................
නිල මුද්‍රාව :

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන : ..............................................
දිනය :....................................
නිල මුද්‍රාව :

ඇමුණුම 06

## ගුරු උපදේශක තනතුරට අන්තර්ග්‍රහණයේ දී අදාළ කරගනු ලබන විෂයයන්

| විෂයය අංකය | විෂයය |
|---|---|
| 1 | ප්‍රාථමික |
| 2 | ඉංග්‍රීසි |
| 3 | විද්‍යාව |
| 4 | ගණිතය |
| 5 | මවුබස |
| 6 | දෙවන බස |
| 7 | ඉතිහාසය |
| 8 | ශාරීරික අධ්‍යාපනය |
| 9 | තොරතුරු තාක්ෂණය |
| 10 | ද්වි භාෂා |
| 11 | මාර්ගෝපදේශනය |
| 12 | ගුරු පුස්තකාලයාධිපති |
| 13 | චිත්‍ර |
| 14 | පෙරදිග නර්තනය/භරත නර්තනය |
| 15 | සංගීතය පෙ/අ/ක |
| 16 | නාට්‍ය හා රංගකලාව |
| 17 | භූගෝල විද්‍යාව |
| 18 | පුරවැසි අධ්‍යාපනය |
| 19 | වාණිජ හා ගිණුම්කරණය |
| 20 | තාක්ෂණය |
| 21 | කෘෂිකර්මය |
| 22 | ගෘහ ආර්ථික විද්‍යාව |
| 23 | විශේෂ අධ්‍යාපනය/ නොවිධිමත් අධ්‍යාපනය |
| 24 | බුද්ධාගම |
| 25 | කතෝලික ධර්මය |
| 26 | ක්‍රිස්තියානි ධර්මය |
| 27 | ඉස්ලාම් ධර්මය |
| 28 | හින්දු ධර්මය |